මාධ්‍ය නිවේදනය

31/10/2026

SPUR (Society for Peace, Unity and Human Rights for Sri Lanka Inc)
Reg: A003 0777 M
P.O. Box 4066, Mulgrave VIC 3170, Australia
Phone: (+613) 9795 7143

'ස්පර්' සංවිධානයට එරෙහිව ද්වේෂ සහගත අසත්‍ය තොරතුරු සහිත ප්‍රකාශයක් සමාජ මාධ්‍යතුල පළවීම

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව, ඒකීය සහ ස්වෛරී භාවය වෙනුවෙන් පෙනී සිටිමින්, දැනට අවුරුදු තිහකට අධික කාලයක් ඕස්ට්‍රේලියාවේ සිට කටයුතු කරනු ලබන, ජාතිහිතෛෂී ශ්‍රී ලාංකිකයින්ගෙන් සැදුම්ලත් 'ස්පර්' නමින් හඳුන්වන අප සංවිධානයේ, සාමාජිකයින් සහ ක්‍රියාකාරකම් පිළිබඳව ද්වේෂ සහගත අසත්‍ය තොරතුරු සහිත ප්‍රකාශයක් ශ්‍රී ලංකාවේ සිට ක්‍රියාත්මක වන මුහුණුපොත් (Facebook) පිටුවක පළවී තිබීම පිළිබඳව සිය අවධානය යොමුකර සිටී.

අප සංවිධානය ආරම්භයේ සිටම, ලොවපුරා විසිර සිටින ඊලාම් බෞද්ධවාදීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව, විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු රජය ආයතන සහ ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කරමින් සිදුකල කටයුතු වලට අමතරව, පහත දැක්වෙන සේවාවන් සඳහා නායකත්වය සපයයි.

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන දරුවන් 85 දෙනුකුට මාසික ශිෂ්‍යත්ව ලබා දීම;
2. උතුරු සහ නැගෙනහිර පුරාවිද්‍යාත්මක ස්ථාන හා විහාරස්ථාන ආරක්ෂා කිරීමට දායක වීම:
3. දිවුල්පොතාන වැනි තර්ජනයට ලක්වූ ගම්මානවල ජීවත් වන අහිංසක සිංහල ජනතාවට සහාය වීම;
4. වැලි ඔය ජනපදයේ පරාක්‍රමපුර දරුවන්ගේ අධ්‍යාපනය සඳහා නව දෙමහල් ශාලාවක් පරිත්‍යාග කිරීම;
5. ගංවතුරෙන් සේදී ගොස් තිබූ මඩකලපුවේ පුන්නිකුඩා නම් සිංහල ගම්මානයට යන මාර්ගය නැවත ගොඩනැගීම.

අප සංවිධානය විසින් කිසිදු පුද්ගලයෙකුගේ නීතිමය කටයුත්තක් සඳහා කිසිදු අරමුදලක් ලබා දී නොමැති බවත්, සංවිධානයේ අරමුදල් වියදම් කිරීම සිදු කරනු ලබන්නේ එහි අරමුණුවලට අනුකූලව වන අතර, ඒ පිළිබඳ විගණන වාර්තා නිසි පරිදි ඕස්ට්‍රේලියාවේ අදාළ බලධාරීන් වෙත සෑම වසරක් පාසාම ඉදිරිපත් කරනු ලබන බවත්, සංවිධානයේ සාමාජිකයින් සැමවිටම අධිකරණ තීරණවලට ගරු කරමින් කටයුතු කරන බවත් මෙහිදී අවධාරණය කිරීමට කැමැත්තෙමු.

ස්තුතියි.

ආචාර්ය දසරත් ජයසූරිය

සභාපති, ස්පර් සංවිධානය, ඕස්ට්‍රේලියාව